# අතීතයේ සිංහල නම්.....හැඳුන හැටි



සිංහලයන්ගේ ගෝත්‍රයෝ ද නැවත වර්ග එක්කෝ පරම්පරා නැතහොත් පවුල් වශයෙන් බෙදී ඇත්තේ ය හෙවත් පවුල් කීපයක් එක්වීමෙන් ගෝත්‍රයක් සෑදී ඇත්තේ ය. මෙසේ බෙදා දැක්වීම සඳහා යොදා ගත් නම්, පෙළපත් නාම යනුවෙන් හඳුන්වනු ලැබේ. සාමාන්‍යයෙන් අතර වාසගම් යනුවෙන් ව්‍යවහාර වන්නේ ද මේ පෙළපත් නාමයය.

එකිනෙක කුලයන් අතර ද, ගෝත්‍රයන් අතර ද උස් මිටි කම් ඇතැයි සලකන්නා සේ ම පෙළපත් අතර ද උස් මිටි කම් සලකනු ලැබේ. කෙතරම් උස් මිටිකම් පළ කරනු ලැබේ දැයි කියතොත් සමහර මංගල ප්‍රස්තාවන්හිදී මගුල් බොජුන් මේසයෙහි දී පොලූ හරඹයට පවා මේ උස් මිටි කම හේතු වන්නේ ය.

පෙළපත නාමයෝ වනාහි කීප ආකාරයකින් ව්‍යවහාරයට පැමිණියේ ය. චන්ද්‍රසේකරගේ, විජයසිංහගේ, අලගියවන්නගේ, ආදි නාම පරම්පරාවෙහි ආදි ප්‍රධානියකුගේ නමින් හඳුන්වනු ලැබේ. ඇදි දුන්න විදි තිලක මුදියන්සේලාගේ ආදි සමහරක් රජුන් විසින් දෙන ලද පටබැඳි නමක් අනුව ද අදිකාරම්ගේ මුහන්දිරම් ගේ කාරිය කරන රාළලාගේ ආදි සමහරක් රජුන් ගෙන් ලද නිල තල අනුව ද කන්කානම්ගේ වැදි සිංහගේ සුදු හකුරුගේ, ගල් වඩුගේ ආදී සමහරක් රැකී රක්ෂා අනුව ද නාරාහේන්පිටගේ, ගල්හේනගේ, ඕමත්තගේ ආදී සමහරක් මුල් පදිංචිය අනුව ද ඇතිවූ පෙළපත් නාමයෝ ය.

රවිඩ නාම මුල් කොට නිපන්, අප්පුකුට්ටිගේ පෙරියප්පෙරුම ගේ ආදී නම් ද පෘතුගීසි නාම මුල් කොට නිපන් පරංගිගේ මෙරිඥද්ඥදගේ ආදී නම් ද ඇත්තේ ය.

මෙබඳු කිසි විශේෂයක් නොතකා ප්‍රවෘත්ති පත්‍රයක දැන්වීමක් පළ කිරීමෙන් ව්‍යවහාරයට ගන්නා නොයෙක් විධි පෙළපත් නම් ද සිංහලයන් අතර තිබේ.

පහළගෙදර මුදියන්සේලාගේ, කන්දගෙදර රාලලාගේ ආදී වශයෙන් මුල් පදිංචි ස්ථානය පෙළපත් නාමය වශයෙන් යොදා ගත්තෝ කන්ද උඩරට පෙදෙස්හි බහුල ය. මේ දක්වන ලද්දේ වර්තමානයේ පවත්නා ක්‍රමයයි.

අතීතයෙහි මෙබඳු පෙළපත් නම් තිබුණු බවට සාක්ෂි අවිද්‍යමානය. කෙනකු වෙසසන්නට අවශ්‍ය වූ කල්හි යොදන ලද්දේ පියාගේනාමයයි. ගහපති නගය පුත තිස (නාග ගෘහපතියාගේ පුත්‍ර තිස්ස) පරුමක පලිකඩ පුත් පරුමක හරුම, (පලිකඩ ගේ පුත් හරුම) පරුමක සිරි කිත. ජිත උපසික චිත (ශ්‍රී චිර්තිගේ දූ චිත්‍රා උපාසිකා) ආදිය ඉතා ඈත සෙල් ලිපිවල සඳහන් ක්‍රමයයි.

මීට සමාන ක්‍රමයක් ද්‍රවිඩයන් විසින් මේතාක් භාවිතා කරනු ලැබේ. පොන්නම්බලම් ගේ පුත් රාමනාථනී යන්න පොන්නම්බලම් රාමනාථන් යනුවෙන් ද, රාමනාථන් ගේ පුත් මහාදේව යනු රාමනාථන් මහාදේව යනුවෙන් පොන්නම්බලම් ගේ පුත් අරුණාසලම් යන්න පොන්නම්බලම් අරුණාසලම් යනුවෙන් ද ඔවුන් විසින් ව්‍යවහාරිත ය.

වර්තමාන ක්‍රමය සිංහලයන් අතර භාවිත වූයේ මුහුදුබඩ රට පෘතුගීසීන්ගේ තෝම්බු සටහන ලිවීමේ පටන් ය. පුත්තලම පටන් මාතර තෙක් ස්වකීය යටත් ප්‍රදේශ වාසීන්ගේ සවිස්තර නාම ලේඛනයක් තැනීම පෘතුගීසි ආණ්ඩුව විසින් අදහස් කරන ලද්දේ ය. මෙහි මූලිකත්වය භාර කරන ලද්දේ අලගියවන්න මුකවෙට්තුමාට ය. ඔහු යටතේ ඒ ඒ පළාත්වල ලේකම්වරු පත් කරන ලදහ.

ආණ්ඩුවේ නියෝගය අනුව තෝම්බුලියා දෙනු පිණිස ලේකම් වරුන් ඉදිරියට පත් තැනැත්තෝ ඉහත දැක්වූ පරිදි පරපුරේ අධිපතියකුගේ හෝ තනතුරක හෝ ගමක හෝ රස්සාවක හෝ පදිංචි ස්ථානයක හෝ නම පෙළපත් නාමය වශයෙන් ලියා දුන්හ. ලන්දේසි ආණ්ඩු කාලයේ මෙය වඩාත් මැනැවින් සම්පූර්ණ කරන ලද්දේ ය ඒ ලිපි ලන්සි තෝම්බුව නමින් මේතාක් රජය භාරයේ පවත්නේ ය. තෝම්බු ලියා දෙන්නට පැමිණි මිනිසකුගෙන් තෝ මොන ගේදි යි ලේකම් තැන ප්‍රශ්න කෙළේලු. වික්ෂිප්ත හෙතෙම මඳක් තතනමින් සිට ණීඅනේ හාමුදුරුවනේ ඒක තමා අමාරු□ යි උත්තර දුන්නේලු. ණීඑහෙනම් තෝ අද පටන් අමාරුගේ□ යයි පවසා ලේකම් තැන තෝම්බුව සම්පූර්ණ කළේලූ. මෑත භාගයෙහි ඒ පෙළපතෙහි වූවෝ ඒ නම පහත් කොට සලකා අමරසිංහ ගේ යයි ද වෙනස් කර ගත්තේලූ.

මේ ප්‍රවෘත්තියෙහි සත්‍යා සත්‍යය කෙසේ වෙතත් සුදුසු නමක් ඒ වේලාවට සපයා ගත නොහැකි වූවන්ට ලේකම්වරුන් විසින් පෙළපත් නමක් නොදෙන ලදැයි කියා හෝ තමන්ගේ නම පහත් යයි සලකන්නවුන් විසින් පසුව එය වෙනස් නොකරන ලදැයි කියා හෝ සලකන්නට ඉඩක් නැත.

සිංහලයෝ ස්වභාවයෙන් ම මානාධිකයෝ ය. නම දික්වූ තරමට ප්‍රීති වන්නෝත් උසස් යයි සලකන්නෝත් ඔවුනතර බොහෝ ය. එහෙයින් මත්ත සමත්ත සුමිත්‍ර සමර දිවාකර නවරත්න කහඳ මුදියන්සේලාගේ සද්ද විද්ද පලඟ පතිර රන්පට බැදි රාජපක්ෂ වික්‍රමසිංහ සේනානායක මතු කුමාරන්නැහෙලාගේ ආදී වශයෙන් බඹ ගණන් දිග පෙළපත් නාම භාවිත කරන්නන් දක්නට ලැබීම අරුමයක් නොවේ.

පහත් යයි සැලැකෙන නම් අතැර උසස් යයි සැලැකෙන පෙළපත් නම් ගන්නන් වර්තමානයේ නිතර පාහේ දක්නට ලැබෙන්නේ ද මේ මානාධික භාවය නිසාම ය.

ක්‍රම ක්‍රමයෙන් නම් දික් ගැසී ගොස් පසු කාලයෙහි විමල ධර්මසූරිය ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ ආදී නම් භාවිතයට බටහ. ණීසමස්ත සාමන්ත භූපාල මණි මෞලි මාලාලංකෘත, නව රත්නාධිපති□ ආදී වශයෙන් ඈඳා ගත් විශේෂ පදත් සමග ගත් කල මේ නම් අතිශයින් දික්විය.

නම් දික්කර ගැනීමට පසු කාලයෙහි ඇතැම් අධිපතීහු රජුන්ටත් වඩා ප්‍රිය කළහ. ණීවිජය සුන්දර සෙනෙවිරත්න පණ්ඩිත මුදියන්සේලා ගේ පිළිම තලව්වේ මහ දිසාවණී ආදී වශයෙන් හඳුන්වන අධිපතීහු නුවර කාලයේ වූහ. දිග නමට සිංහලයන්ගේ මේතාක් ඇති ඇල්ම වර්තමාන

7 වන පිටට

